# එම්.එම්.බී.එල්. පාත්ෆයින්ඩර් අන්තර් ජාතික එස් පහ සහතිකය දිනා ගනී




**එම්.එම්.බී.එල්.** පාත්ෆයින්ඩර් ආයතනය අන්තර් ජාතික එස් පහ සහතිකය හිමිකරගත් ශ්‍රී ලංකාවේ පළමු සමාගම බවට පසුගියදා පත්විය. ඉන්දියාවේ පිහිටි ජාත්‍යන්තර තත්ත්ව සම්මාන සේවා ආයතනය එය නිල වශයෙන් නිවේදනය කළ අතර කයිසෙන් ඵලදායීතා පුද්ගලික සමාගම ඒ සඳහා ප්‍රකාශ පත්‍රය සහ සන්නිවේදන නිල ලාංඡන ප්‍රදානය කරනු ලැබීය.

ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඇති කරන එස් පහ ක්‍රමවේදය අනුගමනය කර සම්මාන දිනාගත් කීර්තිමත් සමාගම් ඇතත් සහතිකය මගින් වාර්ෂිකව තත්ත්ව කළමනාකරණ ඇගයීමක් පවත්වන අතර නිසි විගණනයක් කරන හෙයින් එය පවත්වාගෙන යාම බැරෑරුම් තීරණයක් බව මෙම සහතිකය ප්‍රදානය කිරීමේ අවස්ථාවේදී කයිසෙන් ඵලදායීතා පුස්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ලාල් ෆොන්සේකා මහතා ප්‍රකාශ කළේය. විගණනයට යටත්ව එය අනුගමනය කරමින් අන්තර්ජාතික එස් පහ සහතිකය හිමිකරගත් ශ්‍රී ලංකාවේ පළමු සමාගම මෙම ආයතනය බව සඳහන් කළ හෙතෙම මෙම සහතිකය ප්‍රදානය කර ඇත්තේ කාර්ය සාධනයේ දී අන්තර්ජාතික තත්ත්වය, පරිපාලන ක්‍රමවේද සහ ඵලදායීතාව සහ කාර්යක්ෂමතා උපාය මාර්ග ක්‍රියාවට විශිෂ්ට ලෙස බලපැවැත්වීම වෙනුවෙන් බව ද සඳහන් කළේය.

එම්.එම්.බී.එල්. පාත්ෆයින්ඩර් සමූහ ව්‍යාපාරය පුද්ගලික අංශයේ ප්‍රාග්ධන ආයෝජනය, කීර්තිමත් අන්තර්ජාතික සමාගම් සමග ව්‍යාපාර මෙහෙයැවීම, ආයෝජන බැංකු, ගිණුම් සහ මූල්‍ය, නීති, කළමනාකාරණ හා කළමනාකරණ උපදේශක සේවා, සංචාරක සහ ව්‍යාපාර ප්‍රවර්ධන යන ක්ෂේත්‍රයන්හි නිරත ප්‍රමුඛ ආයතනයක් වන අතර මෑතකදී පෑලියගොඩ මීගමුව පාරේ අංක 339/6 යන ස්ථානයෙහි ස්ථානගත කරන ලදී. ලාල් ෆොන්සේකා මහතා එම නිවේදනය සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂ (පාලන සහ ආරක්ෂක) නන්දන දේවගේ මහතා වෙත භාරදුන් අවස්ථාව ඡායාරූපයේ දැක්වෙයි. සමූහ ව්‍යාපාරයේ නිර්මාතෘ මිලින්ද මොරගොඩ, සභාපතිනී වයි. එන්. පෙරේරා, ප්‍රධාන විධායක කේ. බාලසුන්දරම් මහත්ම මහත්මීන් ඇතුළු කාර්ය මණ්ඩලය මෙම අවස්ථාවට සහභාගී වූහ.